(උ) සුබසාධක, පුනරුත්ථාපන හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඌ) බෞද්ධ සංස්කෘතියේ නවෝදයක් සහ බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රබෝධයක් සඳහා කටයුතු කිරීම;

(එ) නිවන් මගට අත්වැලක් සපයන ශාස්ත්‍රීය ප්‍රකාශන එළිදැක්වීම;

(ඒ) ආධ්‍යාත්මික ජීවිතයට මග කියාදෙන නිවැරදි දහම් දැනුමක් සහිත ගිහි පැවිදි දේශක පිරිසක් බිහිකිරීමට සම්මන්ත්‍රණ හා වැඩමුළු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම;

(ඔ) මාර්ගෝපදේශ හා උපදේශන සේවා මගින් ගැටුම් නිරාකරණයට ප්‍රජාවට සහාය වීම;

(ඕ) තාවකාලික පැවිදිවීමේ අවස්ථා සංවිධානය කර ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම;

(ක) ජාතික හා ආගමික සහජීවන සඳහා කටයුතු කිරීම;

(ග) පදනමේ පරමාර්ථ සාධනයෙහි ලා කැපවන, ධනාත්මක ආකල්ප සහ කුසලතා දක්වන ගිහි පැවිදි නායකයින් අතරින් තෝරාගන්නන් සඳහා දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ච) සතර අගතිවලින් වැළකීමටත්, සතර බ්‍රහ්ම විහරණ හා සතර සංග්‍රහ වස්තු පුරුදු කිරීමටත් මග පෙන්වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම; සහ

(ජ) ප්‍රතිපත්ති පූජාවට මුල්තැන දෙමින් ආමිස පූජාවන් ද අර්ථවත්ව කටයුතු කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී-පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙනයම් හේතුවක් මත පදනම් කරගත් වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලය වගබලා ගත යුතු ය.

